# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 41 දරන ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත

---

[**සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 01 වන දින**]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ඔක්තෝබර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 6.75 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 41 දරන ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ඔක්තෝබර් මස 01 වන දින]

එල්. ඩී.— ඕ. අයි. එන්. සී. 05/2005

### ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙනයාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලද්දේ කවර පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා ඒ සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට සහ ඉටු කොට ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කොට ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 41 දරන ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු "කේන්ද්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමට ද එය පාවිච්චි කිරීමට සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා-නිප්පොන් අධ්‍යාපනික සහ සංස්කෘතික කේන්ද්‍රය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වියයුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ හා ජපානයේ ජනතාව අතර අධ්‍යාපනික හා සංස්කෘතික සම්බන්ධතාව, අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ශ්‍රී ලාංකිකයන් හා ජපන් ජාතිකයන්ට අන්‍යෝන්‍ය සංස්කෘතීන්, අන්‍යෝන්‍ය භාෂා සහ වෙනත් භාෂා ඉගෙන ගැනීමට ආධාර කිරීම, අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම, එවැනි අධ්‍යාපන චාරිකාවලට සහභාගී වන අයට නවාතැන් සැලසීම සහ අධ්‍යාපනික සහ සංස්කෘතික නියෝජිතයන් හුවමාරු කර ගැනීම ;

(ඇ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, සහ සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සහ වර්ධනය කිරීම සඳහා අවශ්‍යයයි සංස්ථාව විසින් සළකනු ලබන පොත්, පුවත්පත්, වාර සඟරා හා වෙනත් ප්‍රකාශන මිලට ගැනීම, ඒවාට දායකවීම හා පල කිරීම ;

(ඈ) ආධාර ලැබීමට සුදුසු ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව, ආධාර දීමනා හා ත්‍යාග ස්ථාපනය කිරීම සහ පිරිනැමීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික, දාර්ශනික, සංස්කෘතික, විද්‍යාත්මක හා කාර්මික අධ්‍යාපන කටයුතුවලට උදව් කිරීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය වෙනත් සමාගම්, සමිති සහ සංවිධාන සමඟ සහයෝගීවීම සහ සහචර්ය වීම ;

(ඊ) අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ජපානයට යන ශ්‍රී ලාංකිකයන්ට මාර්ගෝපදේශකත්වය සහ වෙනත් ආධාර සැපයීම ; සහ

(උ) ශ්‍රී ලාංකික තරුණයන්ගේ හා ළමයින්ගේ කලාත්මක නිර්මාණ, ක්‍රීඩා කෞශල්‍ය සහ කාර්මික දැනුම ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා අවශ්‍ය කර්මාන්ත ශාලා, පාසල් හා ආයතන සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම.

4. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, සංස්ථාවේ තත් කාලයේ වලංගුව බල පවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන සංස්ථාවේ අධ්‍යක්ෂ, මහ ලේකම් සහ ගරු භාණ්ඩාගාරික සහ තවත් සාමාජිකයන් 11 දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත එකී රීතිවලට යටත්ව පවරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ කුමක් සඳහන් වුව ද එය නොතකා පූජ්‍ය උඩගම සුමංගල ස්ථවිරයන් වහන්සේ සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂවරයා ද පූජ්‍ය මීගහතැන්නේ චන්ද්‍රසිරි ස්ථවිරයන් වහන්සේ සංස්ථාවේ ප්‍රථම මහලේකම්වරයා ද විය යුතු අතර ඔවුන් ස්වකීය ධුර වලින් කලින් ඉල්ලා අස් වුවහොත් මිස ජීවිත කාලය තුළ එකී ධුර දැරිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ කේන්ද්‍රයේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත සඳහන් දේ කිරීමට බලය ඇත්තේ ය :—

සංස්ථාවේ පොදු බලතල.

(අ) යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම, දැරීම සහ සංවර්ධනය කිරීම ;

(ආ) එවැනි ම යම් දේපළක් විකිණීම, උකස් කිරීම, කුළියට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය ගෙනයාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ;

(ඈ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගෙන යාම සඳහා කවර වුව ද විදේශීය රටක සංස්ථාවේ ශාඛා පිහිටුවීම ;

(ඊ) බැංකු ගිණුම් විවෘත කිරීම, එය ක්‍රියාත්මක කිරීම සහ වැසීම සහ සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාවේ දේපළ ඇපයට තබා හෝ එවැනි ඇපයක් නොමැතිව හෝ මුදල් ණයට ගැනීම සහ ලබා ගැනීම ;

(උ) සංස්ථාවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සුරැකුම් පත්වල ආයෝජනය කිරීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, පත් කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ කාර්ය සහ ධුර කාලය ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යායපත්‍ර, ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කාරණා ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනි ම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලුම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් "සුදුසුකම්ලත් විගණකවරයකු" විසින් විගණනය කළ යුතු ය.

(4) මෙම වගන්තියෙහි "සුදුසුකම්ලත් විගණකවරයා" යනුවෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කළ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නාවූ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ පාලක මණ්ඩලය නිකුත් කළ සහතිකයක් දරන්නාවූ ද, එවැනි යම් ගණකාධිකාරී සමාගමක්,

අදහස් කෙරේ.

කේන්ද්‍රය විසින් ගෙවිය යුතු හෝ කේන්ද්‍රයට ලැබිය යුතු ණය.

**9**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කේන්ද්‍රයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන ලද සංස්ථාව විසින් ගෙවා බේරුම් කල යුතු අතර, එදිනට කේන්ද්‍රයට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**10**. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ මහ ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, මහලේකම්වරයා සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.